# පන්කුලිය හෙවත් අශෝකාරාමය හා එහි මහායාන බලපෑම පිළිබඳ විමසුමක්

ඩබ්. එම්. චින්තක සඳරුවන්[1]

## හැඳින්වීම

ක්‍රි.පූ. 3 වැනි සියවසේ දී දේවානම්පිය තිස්ස (ක්‍රි.පූ. 250-210) රාජ්‍ය සමයේ සිදුවන මහින්දාගමනයත් සමඟ මහාවිහාරය කේන්ද්‍රගත වෙමින් ශ්‍රී ලාංකීය භික්ෂු සංස්කෘතියත් ඒ හා බැඳුණු මානව සංස්කෘතියේත් විකාශය සිදු විය. සියවස් තුනක් පමණ අඛණ්ඩ ලෙස ගලා ආ භික්ෂු පරපුර වට්ටගාමිණී අභය ( ක්‍රි.ව. 87-76) රාජ්‍ය සමයේ දී මහාවිහාරය, අභයගිරිය වශයෙන් වෙනම නිකායන් වශයෙන් අනු ආයතන ගණනාවක් බිහිකර ගනි. මෙහි දී පන්කුලිය අශෝකාරාමය බිහිවීම කෙරෙහි බලපෑ මහායන අදහස් පිළිබඳවවිමසීමට ලක්කරනු ලැබේ.

## අරමුණු හා පරමාර්ථ

බෞද්ධ ආරාම සැලසුම් සම්ප්‍රදායේ **පබ්බතාරාම** ගණයට අයත්වන පන්කුලිය සියවස් ගණනාවක් පුරාවිවිධ මැදිහත්වීම්වලට ලක්වෙමින් වල්වැදී පැවති හුදකලා සංඝාරාමයක් වන අතර මෙම ස්ථානය පිළිබඳව පවතින සමාජ දැනුම වර්ධනය කිරීමත්, මහායානික විහාර සංකීර්ණයක පවතින ලක්ෂණ මෙම විහාර සංකීර්ණයේ පවතින බවට වන උපකල්පනයන් සනාථ කිරීමත් මෙහි මුඛ්‍ය අරමුණු හා පරමාර්ථ ලෙස දැක්විය හැකි ය.

## ක්‍රමවේදය

පන්කුලිය පිළිබඳ අධ්‍යනයේ දී සාහිත්‍ය මූලාශ්‍රය ගවේෂණය, ක්ෂේත්‍ර ගවේෂණය, සම්මුඛ සාකච්චා හා අන්තර්ජාල ගවේෂණ මාර්ගයෙන් තොරතුරු ඒකරාශි කර ගැනීම සිදු කෙරෙන අතර ගූගල් අ(ර්)ත් (Google Erath), මයික්‍රෝසොෆ්ට් ඔෆිස්, මයික්‍රෝසොෆ්ට් පවර්පොයින්ට් හා පොටෝෂොප් ආදී මෘදුකාංග භාවිත කිරීම සිදු කරයි.

## අන්තර්ගතය

ක්‍රි.පූ. 3 වැනි සියවස ලාංකේය ඉතිහාසයේ වැදගත් කාල පරිච්ඡේදයක් වේ. ඊට හේතුව මහින්දාගමනයත් සමග මෙරට සංස්කෘතිය බුදුදහම පදනම්

---

[1] සහාය කථිකාචාර්ය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශය, මිහින්තලේ

වෙමින් සකස් වීමයි. සියවස් ගණනාවක් යන තෙක්ම මේ තත්ත්වය කිසිදු ගැටලුවක් නොවී පැවතුණු අතර විවිධ රජවරු කුමාරවර ඇමතිවරුන් මෙන්ම බෞද්ධ භක්තිකයෝ ථෙරවාදාය ආරක්ෂා කිරීමටත් ජනප්‍රිය කරවීමටත් ව්‍යාප්තියටත් කටයුතු කරන ලදි. ක්‍රි.ව. පළමු සියවසේ දී මෙම තත්ත්වය වෙනසකට ලක්වේ. මෙම යුගයේ රාජ්‍ය පාලකත්වයට පත් වන වලගම්බා රජු දේශීය හා විදේශිය වශයෙන් ආක්‍රමණයකට මුහුණ දෙයි. එහි දී රාජ්‍යත්වය අහිමි වන රජු වනයෙහි සැඟවෙමින් වාසය කරන සමයේ මහාවිහාරවාසි කුපික්කලතිස්ස තෙරුන් වහන්සේගේ දානයෙන් ජීවිකාව ගෙනයයි. කුපික්කලතිස්ස භික්ෂුව කළමෙම කාර්යය වෙනුවෙන් රජුතිස්ස තෙරුන්ට වැටකේ පතක ලියා ආරාම පුජාවක් කරන අතර රජු නැවත රාජ්‍යත්වයට පත් වීමෙන් පසුව ගිරි නිසණ්ඨාරාමය විනාශ කර අභයගිරි නම් නව විහාරයක් කරවා තිස්ස හිමියන්ට පූජා කරනු ලැබේ. මෙම ආරාම පුජාව පිළිගැනීම ශාසනික වශයෙන් අර්බුද ගණනාවකට හේතු සපයන අතර තිස්ස තෙරුන් මහාවිහාරයෙන් නෙරපීම, උන්වහන්සේගේ ගෝල හිමි නමක් වූ උසුලියාතිස්ස හිමි භික්ෂූන් 500 නමක් රැගෙන මහාවිහාරයෙන් නික්ම අභයගිරි විහාරයට යාම ඒ අතර වැදගත් වේ. ඒ අනුව විනය ගැටලුවක් උද්ගතවන අතර ශාසනික වශයෙන් නිකාය භේදයක් දක්වා එය උත්සන්න වේ. එය මහාවිහාර, අභයගිරිය ලෙස වෙනම විහාර සම්ප්‍රදායන් දෙකක් ආරම්භ වීමට ද හේතු වේ. 7 වැනි සියවස වන විට මහායාන දර්ශනය අභයගිරි විහාරය ඉතා පෘථුල අන්දමින් ප්‍රචාරය කළ බව හියුංසාං වාර්තා සඳහන් කරයි. චීන ජාතික ෆාහියන් හිමි දක්වන ආකාරයට අභයගිරියේ භික්ෂූන් 5000ක් පමණ වාසය කර ඇත. ඒ අනුව මත දර්ශන ව්‍යාප්ත කරනු ලබන උප ආයතන පද්ධතියක් ද අභයගිරිකයින් විසින් නිර්මාණය කර ගත් බව හඳුනාගත හැකි ය. මහායාන දර්ශනය සඳහන් සුත්‍ර, සංස්කෘති ලිපි, තාරා දේව ප්‍රතිමා, බෝධිසත්ත්ව ප්‍රතිමා ආදිය මෙම මහායාන දර්ශනය ව්‍යාප්ත කළ ස්ථාන තුළින් හමුවන සාධක වේ. අභයගිරි විහාරයට උතුරින් පිහිටා ඇති පත්කුලිය අශෝකාරාමය ද මහායානික බෞද්ධ ස්ථානයක් බව බොහෝ දෙනාගේ පිළිගැනීම වේ. මෙහි දී ඒ පිළිබඳ සාක්ෂි ද සොයා බලනු ලැබේ.

ජනප්‍රවාද සාධක අනුව දුටුගැමුණු රජුගේ පුත් වූ සාලිය කුමාරයා ස්වකීය භාර්යාව වූ අශෝකමාලාවගේ නමින් අශෝකාරාමය කරවන ලද බවත් ඔවුන්ගේ ප්‍රේම වෘතාන්තය හා සම්බන්ධ මල් උයනෙහි එය පිහිටා තිබුණු බවත් ජනප්‍රවාදයේ සඳහන් වේ. සාලිය විසින් අඩු කුලයේ කාන්තාවක වූ අශෝකමාලා විවාහ කර ගත් නිසා ඔහුට රාජ්‍යත්වය අහිමි වූ බවත් අතුළු නගරයට ප්‍රවේශ වීමට ද තහනම් වූ බවත් පෙනේ. මේ නිසා පුජනීය ස්ථාන වන්දනා කර ගැනීමට

නොහැකි වූ නිසා මෙම ස්ථානය තෝරාගත් බව ජනප්‍රාවදයේ එයි. එයට හේතු වන්නේ මෙම ස්ථානයේ සිට ප්‍රධාන බෞද්ධ මධ්‍යස්ථාන වන රුවන්වැලි සෑය, අභයගිරිය, ජේතවනාරාමය, මිරිසවැටිය හා මිහින්තලය යන ස්ථාන සියල්ල නැරඹිය හැකි වීමයි. වර්තමානයේ දී ද අශෝකාරාමය හා සාලියපුර යන ප්‍රධාන ගම්මාන දෙකකට මැදිව මෙම ස්ථානය පිහිටා තිබිමෙන් මෙහි යම් සත්‍යතාවක් පවතින්නට ඇති බව උපකල්පනය කළ හැකි ය. මහාවංසයේ සඳහන් වන පරිදි ක්‍රි.ව. 276 ට ආසන්න කාලයේ දී මහසෙන් රජු (ක්‍රි.ව 276 -303)විසින් මෙහෙණවර දෙකක් කළ බව සඳහන් වේ.ඉන් එකක් **'උතුරු අබාහෙබ'** හෙවත් උතුරු දෙසින් පිහිටි මෙහෙණවර ලෙස හඳුනාගත හැකි අතර අනෙක වර්තමාන පංකුලිය ලෙස උපකල්පනය කළ හැකි ය.

මෙම ස්ථානයේ තිබී සොයා ගන්නා ලද හතර වන මහින්ද (ක්‍රි.ව. 956-972) හෙවත් අබා සලමෙවන් අභය රජුගේ සෙල්ලිපියකට අනුව නව වැනි ශතවර්ශයේ දී මෙම ප්‍රතිසංස්කරණ කටයුතු කළ බවත් එය මෙහෙණවරක් උදෙසා කළ බවත් සඳහන් වේ.කෙසේ වෙතත් මෙම විහාර සංකීර්ණය මහායානික සංකල්ප මත ඉදි වූ බවට වන සාධක ගණනාවක් හඳුනාගත හැකි වේ. මෙම ස්ථානය වඩා ජනප්‍රියත්වයට පත්වන්නේ මෙම ස්ථානයේ ඇති බුද්ධ ප්‍රතිමාව නිසාය. පෙර දක්වන ලද තොරතුරු අනුව අභයගිරි විහාරය මහායාන දර්ශනය පිළිගත් අයුරුත් මහායානික අදහස් දරන උප ආයතන බිහිකළ බවටත් සාධක හමුවේ. විහාර සැලැස්ම නිර්මාණය කිරීමේ දීම මහායානික ඉගැන්වීම් අනුවම මෙම විහාරය නිර්මාණය කර තිබීම වැදගත් ලක්ෂණයකි. රෝලන්ඩ් සිල්වා දක්වන පරිදි මහාවිහාර සම්ප්‍රදායෙන් බිදී ගොස් වනවාසිව බිහිවූ ආරාම පංචාවාස ලෙසත් එම ආරාම සැලසුම් ආර මහායාන ග්‍රන්ථයක් වන මංජු ශ්‍රී භාෂිත වාස්තුවිද්‍යා ශාස්ත්‍රය තුළ දක්වන පබ්බතාරාම ගණයට අයත් වන බවත් දක්වයි. පන්කුලිය ආශෝකාරාම ගෝකුලාරාම - වික්‍රන්ත සැලසුම අනුව නිර්මාණය කර ඇති බව වෝල්ටර් මාරසිංහ දක්වයි. ඒසේම මෙම ස්ථානයේ පවතින ගොඩනැගිලි දෙකක් ද එම ගොඩනැගිලි ආශ්‍රයෙන් ලැබුණු පුරාවස්තු ද මෙම ස්ථානය මහායානික ස්ථානයක් බවට සනාථ කරන සාධක වේ. මහායානයට අනුව යක්ෂධාමය හා දිව්‍ය මණ්ඩපය ලෙස හඳුන්වන ගොඩනැගිලිවලින් මහායාන බුදුදහමට අයත් යක්ෂ හා දෙවි දේවතාවන්ගේ ප්‍රතිමා තැන්පත් කිරීම සිදු කළ බව මාරසිංහ දක්වන අතර බෙල් විසින් 1892 වර්ෂයේ දී මෙම ස්ථානයේ සිදු කළ කැණීම් අනුව එවැනි ගොඩනැගිල්ලක ලක්ෂණ පවතින බව හඳුනාගෙන ඇති අතර එම ස්ථානයෙන් මහායාන දේව ප්‍රතිමා කොටස් සොයාගෙන ඇත. එසේම පන්කුලියේ ඇති ප්‍රතිමාව ද මහායානික ලක්ෂණ අනුව නිර්මාණය වූ බුද්ධ ප්‍රතිමාවක් බව සනාථ වේ. එසේම ආසන්න කලාපයේ ඇති අභයගිරි විහාරයත් විජයාරාමයත් මහායානයේ ප්‍රධාන ස්ථාන වූ නිසාවෙන් එම ආසන්නයේම ඇති පන්කුලිය තුළින්

ථෙරවාදි දර්ශනය පවත්වාගෙන යාමට ඉඩ දෙන්නට ඇති බව සිතිමට නොහැකිය. එයට සාක්ෂි සපයන මහායාන සූත්‍ර ධර්ම ලේඛන අභයගිරියෙන් හා විජයාරාමයෙන් හමු වේ. පන්කුලියේ භික්ෂුණීන් වාසය කළේ නම් අනිවාර්යෙන්ම මහායානික භික්ෂු ආරාමයක් ආසන්න කලාපයේ පැවතිය යුතු අතර විනය කර්ම පෙහොය කර්ම හා උපදෙස් ලබා ගැනීමත් භික්ෂූන් වාසය කරන භූමි භාගයක් තුළ භික්ෂුණීන්ගේ වාසස්ථාන සකස් විය යුතු බව භික්ෂුණී ප්‍රාතිමොක්ෂයේ සඳහන් වේ. එම නිසා එම අවශ්‍යතාවන් මහායානික දර්ශනය ක්‍රියාත්මක වූ අභයගිරියෙන් හෝ විජයාරාමයෙන් ලැබිය යුතුම වූ නිසා මෙම ස්ථානය මහායානික දර්ශනයමත ඉදි වූ ස්ථානයක් වශයෙන් උපකල්පනය කළ හැකි වේ.

සමාලෝචනය

විහාර සැකැස්ම සකස් වීමේ සිට එහි පවතින ඉදිකිරීම්, හමුව ඇති පුරාවස්තු අනුව මහායානික දර්ශනය පවතින්නට ඇති ස්තානයක් ලෙස පනකුලිය අශෝකාරාමය දැක්විය හැකි වේ. මහායාන දර්ශනය ව්‍යාප්ත කළ ප්‍රධාන බෞද්ධ මධ්‍යස්ථානය ආසන්න කලාපයේ පිහිටා තිබීම තුළින් මෙය වඩාත් සාධාරණීකරණය කළ හැකි වේ. එසේම නව පර්යේෂණ මෙම ස්ථානය ආශ්‍රිතව සිදු කිරීම මගින් මෙම කරුණුතව දුරටත් සනාථ කර ගැනීමට විද්‍යාත්මකව හැකියාව පවති.

ප්‍රමුඛ පදඃ පන්කුලිය, පබ්බතාරාමය, මහායානය, පුරාවිද්‍යාත්මක වටිනාකම

ආශ්‍රිත ග්‍රන්ථ

*මහාවංසය.* (1996). (සංස්.) ශ්‍රී සුමංගල නාහිමි හා බටුවන්තුඩාවේ දේවරක්ෂිත,කොළඹ. ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

මාරසිංහ, ඩබ්.ල. (1993). *මංජු ශ්‍රී භාශිත වාස්තුවිදයා ශාස්ත්‍රය.* නුගේගොඩඃ පියසිරි ප්‍රින්ටින් සිස්ටම්.

බලගල්ලේ විමල්, ජී. (2006), *ෆාහියන්ගේ දේශාටන වාර්තාව.* බොරලැස්ගමුවඃ විසිදුණු ප්‍රකාශකයෝ.

බුද්ධදත්ත හිමි, පී. (2000) *හියුං සියං භ්‍රමණවෘතතානතය.* කොළඹඃ රත්න පොත් ප්‍රකාශකයෝ.

හෙට්ටිආරච්චි. (1965). *සිංහල විශ්ව කෝෂය 1 වන කාණ්ඩය.* රාජ්‍ය මුද්‍රණ දෙපාර්තමේන්තුව.

හේමලතා, ආර්.ඩී. (2014). *අනුරාධපර පන්කුලිය අශෝකාරාමය.* කොළඹඃ ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.